# දැන්වීමයි

## මහනුවර පිහිටි ඇහැලේපොළ වලව්ව විශේෂ ව්‍යාපෘතියේ භාරකාර (Curator) හා පරිපාලන තනතුරක් සඳහා බඳවා ගැනීම

මහනුවර රාජධානියේ දුරාතීතයේ පැවති ප්‍රෞඪත්වය හා ඊට අදාළ ඓතිහාසික කථා පුවත නිරූපණය කෙරෙන ඉටි ප්‍රතිමා කෞතුකාගාරයක් (wax Museum) සහ Prison Arcade නමින් අලෙවි ප්‍රදර්ශන කුටි 40 කින් සමන්විත අලෙවි සංකීර්ණයක් ඇහැලේපොල වලව්ව තුළ ස්ථාපිත කර ඇත. එම ඇහැලේපොල වලව්ව විශේෂ ව්‍යාපෘතියේ භාරකාර සහ පරිපාලන කටයුතු සඳහා පහත සුදුසුකම් සහිත තැනැත්තන් වෙතින් අයදුම්පත් කැඳවනු ලැබේ. එහි අභිමානවත් පරිපාලකවරයෙකු වීම සඳහා ඔබට ආරාධනා.

**සුදුසුකම්**

- පරිපාලනය සහ කළමනාකරණය පිළිබඳ උපාධිය හෝ ඊට ඉහල අධ්‍යාපන සුදුසුකම් සහිත වීම.
- සංචාරක සහ ආගන්තුක සත්කාරය පිළිබඳව උපාධිය හෝ ඊට ඉහල අධ්‍යාපන සුදුසුකම් සහිත වීම.
- කෞතුකාගාර විද්‍යාව / පුරාවිද්‍යාව / ඉතිහාසය වැනි විෂයන් පිළිබඳ උපාධියක් හෝ ඊට ඉහල අධ්‍යාපන සුදුසුකම් සහිත වීම.

**වෙනත් පොදු සුදුසුකම් :-**

i. වයස අවුරුදු 35 – 60 අතර වීම හා මනා ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුත් අයෙක් වීම.

ii. සිංහල හා ඉංග්‍රීසි භාෂා ලිවීමේ හා කථා කිරීමේ මනා නිපුනත්වය.

iii. අමතර භාෂා පිළිබඳ නිපුණත්වයක් ඇත්නම් එය අමතර සුදුසුකමකි.

**කෞතුකාගාර සේවා සම්බන්ධයෙන් පළපුරුද්දක් ඇත්නම්, තෝරා ගැනීමේදී ඒ සම්බන්ධයෙන් විශේෂ අවධානයක් යොමු කෙරේ.**

**වැටුප් හා දීමනා** :- ආකර්ෂණීය වැටුප් හා දීමනා හිමිය.

**අයදුම්පත්** :- ඔබගේ සුදුසුකම් සහ ඡායාරූපය ඇතුළත් ජීව දත්ත තොරතුරු සහිත අයදුම්පතක් 2026.07.24 දින හෝ එදිනට පෙර ලැබෙන සේ "**තැපැල් පෙට්ටිය 243 - මහනුවර**" යන ලිපිනයට යොමු කරන්න.

**සම්මුඛ පරීක්ෂණයක් මගින් සුදුස්සන් තෝරාගනු ලබන අතර, තෝරා ගැනීම් සඳහා බලපෑම් කිරීම නුසුදුස්සෙකු වීමට හේතු වේ.**

2026.07.15

මානව සම්පත් කළමනාකරු,
ව්‍යාපෘති සැලසුම් අංශය.

Gazette.lk SINCE 2014 AMBITIONS REALIZED